# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**2016 ඔක්තෝබර් මස 14 වන දින**

**II වන කොටස**

**අතිරේකය**

**(2016.10.17 දින නිකුත් කරන ලදී)**


# ද ඉන්ස්ටිටියුට් ඔෆ් සර්ටිෆයිඩ් පබ්ලික් එකවුන්ටන්ට්ස් (සංස්ථාගත කිරීමේ)

(පෞද්ගලික මන්ත්‍රීවරයකුගේ පනත් කෙටුම්පතකි)

**ද ඉන්ස්ටිටියුට් ඔෆ් සර්ටිෆයිඩ් පබ්ලික් එකවුන්ටන්ට්ස් සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

කොළඹ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු එස්. එම්. මරික්කාර් මහතා විසින් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කරන ලදී.


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක.

මිළ : රු. 21.00 යි. තැපැල් ගාස්තුව : රු. 15.00 යි.

## ද ඉන්ස්ටිටියුට් ඔෆ් සර්ටිෆයිඩ් පබ්ලික් එකවුන්ටන්ට්ස් (සංස්ථාගත කිරීමේ)

## ද ඉන්ස්ටිටියුට් ඔෆ් සර්ටිෆයිඩ් පබ්ලික් එකවුන්ටන්ට්ස් සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.

පූර්විකාව.

"ද ඉන්ස්ටිටියුට් ඔෆ් සර්ටිෆයිඩ් පබ්ලික් එකවුන්ටන්ට්ස්" යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන ආයතනයක් ඒ ආයතනයේ පරමාර්ථ සහ ඒ ආයතනයට සම්බන්ධ සියලු කාරනා ඒ ආයතනයේ සාමාජිකයන් එකඟ වූ රීතිවලට අනුකූලව සාර්ථක ලෙස ඉෂ්ට කිරීම සඳහා පිහිටුවාගෙන තිබුණු හෙයින් ද:

එකී ආයතනය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කාරනා සඳහා ද, ඒ පරමාර්ථ සහ කාරණා මෙතෙක් කල් එකී ආයතනය විසින් සාර්ථකව ක්‍රියාත්මක කර සහ ඉටු කර ඇති හෙයින් සහ එම ආයතනය සංස්ථාගත කරනු ලැබීමට ඉල්ලුම් කර ඇති හෙයින් ද, ඒ ඉල්ලීම ඉෂ්ට කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය.

**1.** මේ පනත 2016 අංක දරන ද ඉන්ස්ටිටියුට් ඔෆ් සර්ටිෆයිඩ් පබ්ලික් එකවුන්ටන්ට්ස් ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ද ඉන්ස්ටිටියුට් ඔෆ් සර්ටිෆයිඩ් පබ්ලික් එකවුන්ටන්ට්ස් සංස්ථාගත කිරීම.

**2.** මේ පනත ආරම්භ වන දින සිට හා ඉන් පසු ද ඉන්ස්ටිටියුට් ඔෆ් සර්ටිෆයිඩ් පබ්ලික් එකවුන්ටන්ට්ස් ආයතනයේ (මෙහි මින් මතු "සංගමය" යනුවෙන් සඳහන් කෙරෙන) සාමාජිකයන්ව සිටින තාක් තැනැත්තන් හෝ මෙයින් සංස්ථාපනය කරනු ලබන ආයතනයට මින් මතු සාමාජිකයන් වශයෙන් ඇතුළත් කරගනු ලබන තැනැත්තන් (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කෙරෙන) "ද ඉන්ස්ටිටියුට් ඔෆ් සර්ටිෆයිඩ් පබ්ලික් එකවුන්ටන්ට්ස්"යන නාමය හා අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර, ඒ නාමයෙන් ඒ සංස්ථාව විසින් ද, ඊට විරුද්ධව ද නඩු පවරනු ලැබිය හැකි ය. තව ද, පොදු මුද්‍රාවක් තබා ගැනීමට හා පාවිච්චි කිරීමට ද, තම අභිමතය පරිදි එය වෙනස් කිරීමට ද, පූර්ණ බලය හා අධිකාරය ඊට ඇත්තේ ය.

2—PL 004848—225 (2016/11)

සංස්ථාවේ පොදු පරමාර්ථ.

**3.** සංස්ථාව පිහිටුවනු ලබන්නේ පහත සඳහන් පොදු පරමාර්ථ සඳහා බව මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:—

(අ) ලෝකය පුරා විසිර සිටින හැකියාව ඇති ජනතාවට ගණකාධිකරණයෙහි න්‍යාය හා භාවිත යන සෑම අංශයකින්ම පෙරට ගොස් ඔවුන්ගේ වෘත්තිය පුරාම සාමාජිකයන්ට ආධාර කොට මහජන උනන්දුව වර්ධනය කළ හැකි අධිවෘත්තික සංවිධානයක් ලබා දීම;

(ආ) ව්‍යවහාරික විද්‍යා, කලා, වෙළඳාම් හා වෘත්තීන්, රාජ්‍ය හා මහජන සේවා පරිපාලනය, කර්මාන්ත හා වාණිජ සේවා ආශ්‍රයෙන් මහජන යහපත උදෙසා ගණකාධිකරණය ප්‍රවර්ධනය කර ඒ මගින් මහජන අධ්‍යාපනය උසස් කිරීම;

(ඇ) ජීවිතය පුරා ගණකාධිකාරීන්ගේ උන්නතියට ආධාර දෙමින් ගණකාධිකරණයෙහි කාර්ය සාධන ප්‍රමිතීන් උසස් කොට ගණකාධිකාරීන්ට පෞද්ගලිකව පුහුණුව ලබා දෙමින් දියුණුවට අවස්ථා සැලැස්වීම;

(ඈ) ගණකාධිකරණ අධ්‍යයනය ප්‍රවර්ධනය කිරීම සහ සංවර්ධනය කිරීම සහ ගණකාධිකරණයේ නිවැරදි මූලධර්ම, ශිල්පීය ක්‍රම හා භාවිතයන් අදාල කරගැනීමට උනන්දු කිරීම;

(ඉ) කර්මාන්ත, වාණිජ, අධ්‍යාපන, මූල්‍ය, රාජ්‍ය සේවය, පෞද්ගලික සේවය සහ තොරතුරු තාක්ෂණය යනාදී ක්ෂේත්‍රවල වෘත්තියේ යෙදීමේ දී ගණකාධිකරණ වෘත්තිය ප්‍රවර්ධනය කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම;

(ඊ) වෘත්තීය ගිණුම්කරණ සුදුසුකම් දක්වා දිවෙන සහතිකලත් ප්‍රසිද්ධ ගණකාධිකරණ වැඩසටහනක් පවත්වා ගෙන යාම සහ එවැනි සුදුසුකමක ඇති වැදගත්කම අවධාරණය කිරීම සඳහා පියවර ගැනීම;

(උ) පුළුල් වශයෙන් වෘත්තියට අහිතකර බලපෑම් වන ප්‍රශ්න සලකා බැලීම සහ නීති පැනවීම හෝ නීතියේ හෝ පරිචයේ වෙනස්වීම්වලට සහයෝගය හෝ විරෝධය දැක්වීම;

(ඌ) විශිෂ්ඨ ගණකාධිකරණ දැනුමක් සහ නායකත්ව කුසලතා සහ ආශ්‍රිත කරුණුවලින් යුත් සාමාජිකයන් බිහි කිරීම;

(එ) මුළු ලොව පුරාම සහ ශ්‍රී ලංකාව තුළ පෞද්ගලික සේවයේ, කර්මාන්ත ක්ෂේත්‍රයේ හෝ රාජ්‍ය සේවයේ නියුතු ගණකාධිකාරිවරුන් විසින් සපයනු ලබන වෘත්තීයමය සේවාවන් සහ ඒ ආශ්‍රිත සහ ඊට සම්බන්ධ සියලු විෂයයන් පිළිබඳ ගිණුම්කරණය ඉහළ මට්ටමකට ගෙන ඒම;

(ඒ) ලෝකයේ සංවර්ධන සහ නව දැනුම සමග ඉදිරියට යාම උදෙසා අදාල සිදුවීම්, අදහස් සහ සංකල්ප පුළුල් ලෙස හඳුන්වා දීම, සාමාජිකයන්ට ජාත්‍යන්තර ප්‍රමිතීන්ට සරිලන සුදුසුකම් ලබා දීම;

(ඔ) රාජ්‍ය සේවයේ හෝ වෙනත් සේවාවකට අදාල ගණකාධිකාරිවරුන්ගේ වෘත්තීය ස්වාධීනත්වය ආරක්ෂා කොට රැක බලා ගැනීම, ඔවුන් පිළිබඳ වෘත්තීයමය අධීක්ෂණයේ නිරතවීම, පරිචයන් පිළිබඳව ඉහළ මට්ටමේ වෘත්තීයමය ප්‍රමිතින් පවත්වාගෙන යාම සහ ප්‍රවර්ධනය කිරීම, ගණකාධිකාරී වෘත්තීය තත්ත්වය ආරක්ෂා කිරීම සහ දියුණුවට අදාල විය හැකි වෙනත් සියලුම දෑ කිරීම;

(ඕ) උසස්තම තාක්ෂණික හා ආචාර ධර්මීය සම්මතයන්ට අනුකූලව ලෝකයේ ගණකාධිකරණ වෘත්තීන් සමග සමපාත වනු පිණිස ශ්‍රී ලංකාවේ ගණකාධිකරණ වෘත්තිය වර්ධනය කිරීම;

(ක) ශාස්ත්‍රපති මෙන්ම දර්ශනපති මට්ටම්වල දී සාමාජිකයන්ට පශ්චාත් උපාධි සංවර්ධන වැඩසටහන් සඳහා සුදුසුකම් සැපයීම;

(ග) සහතික ලත් රාජ්‍ය ගණකාධිකාරීන් වශයෙන් සුදුසුකම් ලැබීමට උනන්දුවක් දක්වන පුද්ගලයන්ගේ වෘත්තීය අධ්‍යාපන කටයුතු සහ ප්‍රායෝගික පුහුණු කිරීම් ක්‍රියාත්මක කිරීම සහ පාලනය කිරීම සහ ශිෂ්‍යයන් විසින් අධ්‍යයනය කළ යුතු ප්‍රායෝගික පුහුණු වැඩසටහන් අනුමත කිරීම;

(ච) අධ්‍යාපනය, පුහුණුව සහ විභාගයට අදාළ ආයතනයේ කාර්යයන් සැලකිල්ලට ලක් කොට ආයතනය විසින් පවත්වා ගෙන යනු ලබන පාඨමාලා නිර්දිෂ්ඨ කිරීම සහ අනුමත කිරීම;

(ජ) අවශ්‍ය වෘත්තීය සුදුසුකම් ප්‍රදානය කිරීම පිණිස විභාග පැවැත්වීම හා ආයතනයේ විභාගවලින් නිදහස් කිරීම ලබා දෙන්නා වූ ගණකාධිකරණ පාඨමාලා පැවැත්වීම පිණිස පිළිගත් දේශීය හා විදේශීය වෘත්තීය හා අධ්‍යාපනික ආයතන සමග සහයෝගයෙන් ක්‍රියා කිරීම;

(ට) විශ්වවිද්‍යාල සහ වෙනත් උසස් අධ්‍යාපන ආයතනවල ගණකාධිකරණ අධ්‍යයනය ප්‍රවර්ධනය කිරීම, සහයෝගයෙන් කටයුතු කිරීම හා සහාය දැක්වීම;

(ඩ) ආයතනයේ සාමාජිකත්වය ලබාගැනීමෙහිලා බලපැවැත්වෙන සුදුසුකම් හා නුසුදුසුකම් නිර්දිෂ්ඨ කිරීම සහ ආයතනයේ සාමාජිකයන්ට අදාළ වෘත්තීය හැසිරීම් හා ආචාර ධර්ම පිළිබඳ ප්‍රමිතීන් ස්ථාපනය කිරීම;

(ණ) සාමාජිකයන්ගේ යහපත පිණිස අඛණ්ඩ වෘත්තීය අධ්‍යාපන පහසුකම් සංවිධානය කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම;

(ත) ගණකාධිකරණ ක්ෂේත්‍රයේ කටයුතුවලට උනන්දුවක් දක්වන සාමාජිකයන්ගේ, ශිෂ්‍යයන්ගේ සහ වෙනත් අයගේ භාවිතය සඳහා ගණකාධිකරණය සහ ඊට අදාළ විෂයයන් පිළිබඳ මුද්‍රිත මෙන්ම විද්‍යුත් මාධ්‍යයේ පොත්පත්, වාර සඟරා අඩංගු පුස්තකාලයක් පවත්වාගෙන යෑම;

(ද) රාජ්‍ය ගණකාධිකරණ ක්ෂේත්‍රයේ නිපුණතා දක්වන පුද්ගලයන් සඳහා ශිෂ්‍යත්ව, සම්මාන සහ ත්‍යාග පිරිනැමීම;

(න) ආයතනයේ සාමාජිකයන්ට සහ ආයතනය විසින් නිර්දේශිත කොන්දේසි සපුරාලන තැනැත්තන්ට ඩිප්ලෝමා සහ සහතික පත්‍ර ප්‍රදානය කිරීම;

(ප) ගණකාධිකරණ සංවර්ධනයේ කේන්ද්‍රයක් වීම සහ වෘත්තියේ කටයුතු වෙනුවෙන් පුරෝගාමියකු වීම;

(බ) නායකත්වය සහ විශිෂ්ඨ කළමනාකරණය කෙරෙහි යොමු කිරීම ඔස්සේ ආර්ථික සහ සමාජීය යහපැවැත්ම දියුණු කිරීම අරමුණු කළ අපගේ කැපවීමට කොටස්කරුවන් වන සියලුම සංවිධාන සමග පවත්නා හවුල්කාරී ක්‍රියාකාරිත්වය වර්ධනය කිරීම;

(ම) විශාල බහුජාතික සමාගම්වල සිට කුඩා හා මධ්‍යම පරිමාණයේ ව්‍යාපාර දක්වා වූ ද මහජන සේවාවන් සපයන ආයතනවල සිට වෘත්තීය සමාගම් හා ලාභ අපේක්ෂා නොකරන සංවිධාන දක්වා වූ ද ආයතන ඇතුළු කර්මාන්ත ක්ෂේත්‍රයේ සියලුම අංශවලට උපරිම ප්‍රතිඵල ළඟා කර දීමට සමත් ගණකාධිකාරීන් හඳුනාගෙන ඔවුන් පුහුණු කිරීම;

(ය) ඵලදායක කළමනාකරණයේ දී ප්‍රයෝජනවත් මෙවලමක් වශයෙන් ගණකාධිකරණ අධ්‍යාපනයේ වැදගත්කම පිළිබඳ උනන්දුව උත්තේජනය කිරීම;

(ර) සම්මේලන, රැස්වීම්, දේශන, සම්මන්ත්‍රණ සහ සාකච්ඡා වැනි විවිධ මාර්ගයෙන් සන්නිවේදනය කිරීමට, හමුවීමට සහ තොරතුරු හුවමාරු කරගැනීමට සාමාජිකත්වය දරන හෝ නොදරන ගණකාධිකාරීවරුන්ට සහ සංවිධානවල අධ්‍යක්ෂවරුන්ට හා ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වයට අවස්ථාව ලබාදීම;

(ළ) සම්මන්ත්‍රණ, රැස්වීම් සහ සම්මේලන ඇතුළු වෙනත් සිද්ධි සංවිධානය කිරීම හා විද්වත් ලිපිලේඛන කියවීම ප්‍රවර්ධනය කිරීම;

(ව) ගණකාධිකාරීවරුන්ගේ ව්‍යාපාරික සහ ක්‍රියාත්මක පරිසරයට බලපෑමක් එල්ල කරන නියාමන හෝ වෙනත් ආකාරයේ කරුණු සම්බන්ධයෙන් ගණකාධිකරණ වෘත්තිය වෙනුවෙන් ප්‍රකාශකයකු මෙන් කටයුතු කිරීම;

(ඝ) ආයතනයේ පරමාර්ථවලට මුළුමනින්ම හෝ අර්ධ වශයෙන් හෝ සමාන පරමාර්ථ තිබෙන්නා වූ ද ශ්‍රී ලංකාවේ හෝ ලෝකයේ වෙනත් ස්ථානයක ස්ථානගත වී ඇත්තා වූ ද ඕනෑම පුද්ගලයන්, සංගම්, ආයතන, සංවිධාන සහ රාජ්‍ය බලධාරීන් හා නියෝජිතායතන සමග සබඳතා පවත්වා ගැනීම, ඔවුන්ගෙන් උපදෙස් ලබා ගැනීම, ඔවුන් සමග සහයෝගයෙන් කටයුතු කිරීම සහ අන්තර්ජාතික වශයෙන් ශ්‍රී ලංකාවේ ගණකාධිකරණ වෘත්තිය නියෝජනය කිරීම;

(ඞ) අදහස් සහ අත්දැකීම් හුවමාරු කර ගැනීම මාර්ගයෙන් ගණකාධිකරණ ක්ෂේත්‍රයේ නියැළී සිටින පුද්ගලයන් අතර, සම්බන්ධතා දිරිමත් කිරීම සහ එම පරිචයන්ට අදාළ ක්ෂේත්‍රයට අදාළ නීති සම්පාදනය අංශයන් කෙරෙහි සැලකිලිමත් වීම;

(ළ) ගණකාධිකරණ විෂයය මෙන්ම ඊට අදාළ ගැටලු පිළිබඳ අදහස් හා මතයන් හුවමාරු කර ගැනීමට පහසුකම් සැලසීම සහ ඒවා පිළිබඳ වඩා යහපත් අවබෝධයක් ප්‍රවර්ධනය කිරීම;

(අඅ) එක් එක් සමාගමක් විසින් සකස් කරනු ලැබූ පුහුණු වැඩසටහන් සැපයීම සහ තනි පුද්ගල ගණකාධිකාරීවරුන් සඳහා පුහුණුවීමේ හා සංවර්ධන අවස්ථාවන් ලබා දීම;

(අආ) ආයතනයේ අරමුණු තවදුරටත් සාක්ෂාත් කර ගැනීම පිණිස සාහිත්‍ය කෘති, පොත්පිංච සහ වෙනත් සන්නිවේදන ආකෘති ප්‍රකාශයට පත් කිරීම හෝ ප්‍රකාශනය සඳහා සහාය දැක්වීම;

(අඇ) පර්යේෂණ පැවැත්වීම හෝ පර්යේෂණ පැවැත්වීම ප්‍රවර්ධනය කිරීමත් එවැනි පර්යේෂණවල ඵලදායක ප්‍රතිඵල ප්‍රකාශයට පත් කිරීම අධ්‍යයනය, පර්යේෂණය සහ අධ්‍යාපනය සඳහා පහසුකම් සැලසීම;

(අඈ) විත්‍රයට, පටිගත කිරීම් සහ ඕනෑම ආකාරයක ලිඛිත, මුද්‍රිත හෝ විද්‍යුත් සන්නිවේදන කෘති ප්‍රකාශයට පත් කිරීම, නිෂ්පාදනය කිරීම සහ බෙදා හැරීම හා ප්‍රකාශයට පත් කිරීමේ, නිෂ්පාදනය කිරීමේ සහ බෙදාහැරීමේ කාර්යයන්ට සහාය දැක්වීම මෙන් ම අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා යෝග්‍ය ඕනෑම ආකාරයකින් ප්‍රචාරණය කිරීම;

(අඉ) පුස්තකාල ස්ථාපනය කොට පවත්වාගෙන යෑම හා ජනතාවට ඒවා විවෘත කිරීම;

(අඊ) ගණකාධිකරණ පර්යේෂණ හා අධ්‍යාපන කටයුතුවල දී නායකත්වය සැපයීම;

(අඋ) මහජනතාවට මෙන්ම සේව්‍යයන්ට හා අනුග්‍රාහකයන්ට යහපතක් ලබා දීමට හැකි ඉහළ වෘත්තීය මට්ටමකින් වටිනා සේවාවන් ලබාදීමට අදාළ පාර්ශ්වවලට හැකි වන පරිදි සාමාජිකයන්ට සම්පත්, තොරතුරු සහ නායකත්වය සැපයීම;

(අඌ) සහතික ලත් ප්‍රසිද්ධ ගණකාධිකාරීවරුන්ගේ අධ්‍යාත්මික ඍජුභාවය, අභිප්‍රාය, කාර්යක්ෂමභාවය සහ වෘත්තීය මට්ටම පිළිබඳව මහජනතාවගේ දැනීම වර්ධනය කිරීමේ සහ සහතික ලත් ප්‍රසිද්ධ ගණකාධිකාරීවරුන්ගේ (CPA) අවශ්‍යතා සහ දැක්ම විමසීම;

(අඑ) උසස් මට්ටමකින් සුදුසුකම් ලැබූ තැනැත්තන් සහතිකලත් ප්‍රසිද්ධ ගණකාධිකාරීවරුන් (CPA) ගේ තත්ත්වයට පත්වන ලෙසට දිරිදීම සහ අධ්‍යයන වැඩසටහන් ප්‍රවර්ධනය කිරීම;

(අඒ) වෘත්තීය ප්‍රමිතීන් ස්ථාපනය කිරීම, තම වෘත්තීය චර්යාව කාර්යසාධනය සහ විශාරදත්වය අඛණ්ඩව වැඩි දියුණු කරගැනීම සඳහා සාමාජිකයන්ට උදව් කිරීම සහ ප්‍රවර්තන ප්‍රමිතීන් සහ අවශ්‍යතා වලංගු කිරීම සඳහා එවැනි කාර්යසාධනයන් දැනුවත් කිරීම;

(අඔ) මූල්‍ය වාර්තාකරණයේ උසස් ප්‍රමිතිය පවත්වාගෙන යාම සඳහා අර්ථවත් උත්තරවාදනයක් ඇති කිරීම;

(අඕ) ගණකාධිකරණ අධ්‍යාපන කටයුතු, පුහුණුවීම් හා අත්දැකීම් පිළිබඳ සම්මතයන් නිශ්චය කිරීමත්, විභාග සහ වෙනත් පරීක්ෂණ පැවැත්වීම සහ සහතික, ඩිප්ලෝමා සහ උපාධි පිරිනැමීම;

(අක) විගණකවරුන්ගේ වෘත්තීය මට්ටම උසස් තත්ත්වයකට ගෙන එමින් ආයෝජකයන්ගේ විශ්වාසය ශක්තිමත් කිරීම;

(අග) ආයතනයන් විසින් මුහුණ දෙනු ලබන ගැටලු වලට කන්දීම සඳහා ව්‍යාපාර වාර්තාකරණ ක්‍රියාදාමයට නිත්‍ය වර්ධනයන් බාර ගැනීම සහ පරිපූර්ණ, තේරුම් ගත හැකි සහ ආයෝජකයන්ට වගකිව යුතු ක්ෂණිකව ප්‍රතික්‍රියා කරන ව්‍යාපාර වාර්තාකරණ ක්‍රමයක් කරා යාම;

(අච) ගණකාධිකරණ වෘත්තීය සහ අධ්‍යාපනයට පිවිසීම සඳහා ප්‍රමිතීන් පවත්වාගෙන යාමට උදව් කිරීම සහ ශ්‍රී ලංකාවේ සහ වෙනත් රටවල වෘත්තීය ගණකාධිකාරීවරුන් අතර සුහද සබඳතාවය දිරිමත් කිරීම;

(අජ) ඩිප්ලෝමා, උපාධි අපේක්ෂක හා පශ්චාත් උපාධි මට්ටම්වල දී ගණකාධිකරණය හා ආශ්‍රිත වෙනත් අධ්‍යයනයන් ක්ෂේත්‍ර හා සුදුසුකම්වලට මගපාදන පාඨමාලා පැවැත්වීමේ අරමුණ වෙනුවෙන් විශේෂයෙන් පොදු රාජ්‍ය මණ්ඩලයේ විශ්ව විද්‍යාලවල, උතුරු ඇමෙරිකානු විශ්වවිද්‍යාල සහ අධ්‍යාපන ආයතනවල සාමාජික ආයතන වැනි විවිධ විශ්ව විද්‍යාල සමග ගිවිසුම්වලට, ඒකාබද්ධවීම් වලට, වලංගුතාවලට හා අන්‍යොන්‍ය වශයෙන් සහාය දැක්වීම් වලට එළැඹීම;

(අට) ආයතනික පුහුණු පහසුකම් සහිත ස්වාධීන පුහුණු සංවිධාන සමග කටයුතු කිරීම, ආයතනික වශයෙන් අනුමත පුහුණු හා සංවර්ධන වැඩසටහන් ලබාදීම හා සුදුසුකම් ප්‍රදානය කිරීම;

(අඩ) මහජන පුහුණු සහ අධ්‍යාපන මධ්‍යස්ථාන ස්ථාපනය කොට ක්‍රියාත්මක කිරීම;

(අණ) ගණකාධිකරණ අධ්‍යයනය ධෛර්යමත් කිරීම, සහායක සේවාවන් සැපයීම ප්‍රවර්ධනය කිරීම හා ඊට අනුබල දීම, ආයතනයේ සාමාජිකයන් හෝ පොදු මහජනතාව සඳහා ස්වාධීන වශයෙන් හෝ වෙනත් අය සමග දේශන, පාඨමාලා හා පන්ති ස්ථාපනය කොට මෙහෙයවීම හා

තෑගි හෝ වෙනත් ත්‍යාග හෝ සම්මාන ලබා දීම හා සාමාජිකයන් අතර වෘත්තීය සහ වෙනත් තොරතුරු ප්‍රචාරණය කිරීම, පුස්තකාල හා ප්‍රකාශන ස්ථාපනය කොට දායක වී අනුබල දීම, සාමාජිකයන්ගේ භාවිතය සඳහා ආකෘතිපත්‍ර හෝ පූර්වාදර්ශ සැපයීම;

(අත) ගණකාධිකරණ හා කළමනාකරණ දැනුම ප්‍රචාරය කිරීම පිණිස වැඩමුළු, සාකච්ඡා සහ සම්මන්ත්‍රණ සංවිධානය කිරීම;

(අද) ආයතනය විසින් අනුමත කරන ලද ප්‍රායෝගික අධීක්ෂණ වැඩ පිළිවෙලක් සඳහා සාමාජිකයන් බඳවා ගැනීම සහතික කිරීම;

(අන) ආයතනය ලියාපදිංචි කිරීමට, සංස්ථාගත කිරීමට හෝ වෙනත් ආකාරයකින් බලගැන්වීමට හෝ නියෝජනය කිරීමට අවශ්‍ය විධිවිධාන සැලැස්වීම හෝ ශ්‍රී ලංකා සමාජවාදී ජනරජයෙන් බාහිර රටක හෝ ස්ථානයක හෝ සම්බන්ධීකරණ කාර්යාල විවෘත කිරීම;

(අප) අදාල ආශ්‍රිත සංවිධාන සමග සම්බන්ධීකරණය හෝ සම්බන්ධතාව පවත්වා ගැනීම සහ ආයතනයේ දැක්ම හා අරමුණු සාක්ෂාත් කරගැනීම පිණිස ශ්‍රී ලංකාවේ හෝ පුද්ගලයන් හෝ සංවිධාන සමග ගිවිසුම් හෝ කොන්ත්‍රාත්තුවලට එළඹීම;

(අබ) ලෝකයේ ඕනෑම ස්ථානයක ආයතනයේ උප කාර්යාල ස්ථාපනය කිරීම, ඒවා පාලනය කිරීම සහ වසා දැමීම;

(අම) ආයතනයේ යහපත වෙනුවෙන් ස්වේච්ඡා කටයුතු ඉටු කිරීම ධෛර්යමත් කිරීම;

(අය) ආයතනයේ ත්‍යාගශීලී අරමුණුවලට සමාන අරමුණු තිබෙන ආයතන හෝ විද්‍යායතන හෝ ස්ථාපනය කොට සහාය දැක්වීම හෝ ඒවා ස්ථාපනය කිරීමේ හා ඒවාට සහාය දැක්වීමේ කටයුතුවලට අනුබල දීම හෝ ඒවායේ

සාමාජිකයකු වීම සහ ආයතනයේ අරමුණු තවදුරටත් ප්‍රවර්ධනය කිරීමේ අභිප්‍රායයෙන් ත්‍යාගශීලී කටයුතු සඳහා මුදල් යෙදවීම හෝ මුදල් ලැබීම සහතික කිරීම;

(අර) ඕනෑම ගොඩනැගිල්ලක්, දේශන ශාලාවක්, පුස්තකාලයක් හෝ හෝ කාර්යාලයක් අත් පත් කරගැනීම, ඉදි කිරීම, වෙනස් කිරීම, අවශ්‍ය භාණ්ඩ සැපයීම, පවත්වාගෙන යාම හෝ කළමනාකරණය කිරීමත් ආයතනයේ වැඩ කටයුතු සඳහා ඕනෑම ඉඩමක් අත්පත් කර ගැනීම හෝ අන්සතු කිරීමත් සහ ආයතනය විසින් හිමිකම් දක්වනු ලබන හෝ භාවිත කරනු ලබන ඕනෑම ගොඩනැගිල්ලකට එරෙහිව පැන නැගිය හැකි ආපදාවක් වෙනුවෙන් එය රක්ෂණය කිරීම;

(අළ) ආයතනයේ වැඩකටයුතු සඳහා අවශ්‍ය මෙවලම් ආනයනය කිරීම සහ ආයතනයේ අරමුණු සාක්ෂාත් කර ගැනීම පිණිස උපකරණ අරමුදල් සහ වෙනත් සහාය ලබා ගැනීම;

(අව) චංචල සහ නිශ්චල වැනි ඕනෑම ස්වරූපයක දේපල (වාණිජ, කාර්මික සහ බැංකු ව්‍යාපාරයක කොටස්) ලබාගැනීම මිල දී ගැනීම, බදු ගැනීම, බලපත්‍ර ලබා දීම, කුලියට දීම, විකිණීම හෝ අත්පත් කර ගැනීම සහ ඔප්පුවකින් අන්තිම කැමති පත්‍රයකින් උරුම කළ දේපලක් භාර ගැනීම;

(අස) ආයතනය සමග ඒකාබද්ධ වීමට බලය පවරා තිබෙන්නා වූ ඕනෑම පුද්ගලයකු හෝ ආයතනයක් හෝ සතුව පවතින දේපළ, වත්කම්, බැරකම් සහ ගිවිසගත් කාර්ය මුළුමනින්ම හෝ ඒවායින් කොටසක් වශයෙන් මිලට ගැනීම හෝ වෙනත් ආකාරයකින් පවරා ගෙන පවත්වා ගෙන යෑම;

(අහ) ආයතනය සමග ඒකාබද්ධ වීමට බලය පවරා තිබෙන්නා වූ ඕනෑම පුද්ගලයෙකුට හෝ ආයතනයකට ආයතනය සතු දේපළ, වත්කම්, බැරකම් සහ ගිවිසගත් කාර්ය මුළුමනින්ම හෝ ඒවායින් කොටසක් වශයෙන් පවරා දීම;

(අල) නීතියට අනුව සපුරාලිය යුතු කිසියම් කැමැත්තකට යටත්ව, ආයතනය සතුව තිබෙන දේපල සියල්ලම හෝ ඉන් කොටසක් හෝ විකිණීම, කුලියට දීම, උකස් කිරීම හෝ පැවරීම;

(ආඅ) සියළුම දේපල හා වත්කම් පවරා ගෙන අත්පත් කර ගැනීම හා සංස්ථාගත කිරීමට පෙර පැවැති "ඉන්ස්ටිටියුට් ඔෆ් සර්ටිෆයිඩ් පබ්ලික් එකවුන්ටන්ට්" හි වගකීම් සහ එය විසින් කළ යුතු දෑ සියල්ල ඉටු කිරීම සහ ඊට ආනුෂංගික ක්‍රියාවන් හා දේවල් සිදු කිරීම;

(ආආ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් ඕනෑම රටක පරිත්‍යාගශීලීන්ගේ ප්‍රදානයයන්, ත්‍යාග, පරිත්‍යාග ආධාර මුදල් සහ දායක මුදල්, මුදලින් හෝ ද්‍රව්‍යවලින් ලබාගැනීම හෝ එකතු කිරීම;

(ආඇ) සාමාන්‍යයෙන් (පාර්ලිමේන්තුවට පනත් කෙටුම්පත් හෝ පනත් කෙටුම්පත් ඉදිරිපත් කිරීම ද ඇතුළුව) ආයතනයේ අදහස් සහ පරමාර්ථයන්ගේ උන්නතිය පිණිස අවශ්‍ය යැයි සැලකෙන හා ඊට ආනුෂංගික වෙනත් නිත්‍යානුකූල දෑ වරින් වර ඉටු කිරීම.

සංස්ථාවේ බලතල.

**4.** මේ පනතේ විධිවිධානවලට යටත් ව:—

(අ) ආයතනයේ කාර්යය සඳහා අවශ්‍ය වන්නා වූ ඉඩම් හෝ ගොඩනැගිලි මිළයට ගැනීමට, අත් කරගැනීමට, කුලියට ගැනීමට, ඉදිකිරීමට හා අන්‍යාකාරයෙන් ලබා ගැනීමට;

(ආ) යම් නිශ්චල හෝ චංචල දේපලක් බද්දට හෝ කුලියට දීම, උකස් කිරීම, ඔඩපනය කිරීම, විකිණීම හෝ අන්‍යාකාරයකින් නියාදනය කිරීම;

(ඇ) ආයතනයේ කාර්ය සඳහා රජයේ හෝ අනුමත බැංකු හා ආයතනවලින් කොන්දේසි මත ඇප ඇතිව හෝ නොමැතිව මුදල් ණයට ගැනීමට හෝ ලබා ගැනීමට හෝ ආධාර සහ පරිත්‍යාග (දේශීය හෝ විදේශීය) වශයෙන් ලබා ගැනීමට;

(ඇ) විනිමය බිල්පත්, චෙක්පත්, පොරොන්දු නෝට්ටු සහ වෙනත් ගනුදෙනු කළ හැකි සාධන පත්‍ර සෑදීමට, ලිවීමට භාරගැනීමට, වට්ටම් දීමට, පිටසන් කිරීමට, ගනුදෙනු කිරීමට මිලට ගැනීමට, විකිණීමට, නිකුත් කිරීමට සහ බැංකු ගිණුම් විවෘත කිරීමට, ක්‍රියාත්මක කිරීමට, පවත්වාගෙන යාමට සහ වැසීමට;

(ඉ) ආයතනයේ කාර්ය සඳහා වහා ම අවශ්‍ය නොවන යම් අරමුදලක් පාලක සභාව හෝ ආයතනය සුදුසු යැයි සළකනු ලබන ආකාරයකින් ආයෝජනය කිරීම;

(ඊ) ආයතනය වෙත සලසනු ලබන යම් සේවාවක් වෙනුවෙන් ගාස්තු ගෙවීමට;

(උ) යම් තැනැත්තකු යම් සමාගමක් හෝ පුද්ගල මණ්ඩලයක් සමග ගිවිසුම්වලට හෝ කොන්ත්‍රාත්වලට එළඹීමට;

(ඌ) ස්වකීය නිලධරයන් සහ සේවකයන් පත් කිරීමට, සේවයෙහි නියුක්ත කිරීමට, ඔවුන් සම්බන්ධ විනයානුකූලව කටයුතු කිරීමට, සේවයෙන් පහ කිරීමට හෝ ඔවුන්ගේ සේවය අවසන් කිරීමට සහ ආයතනය විසින් තීරණය කරනු ලබන යම් වැටුප් දීමනා සහ පාරිතෝෂික ගෙවීමට;

(එ) ආයතනයේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා පුද්ගලයන්ගේ සේවය ලබා ගැනීමට;

(ඒ) තම සේවක පිරිස් වෙනුවෙන් කාර්ය සාධන ප්‍රමිතීන් සකස් කිරීමට, එවැනි සාධනය ඇගයීමට සහ ඒ මත සාධාරණ පියවර ගැනීමට;

(ඔ) තම සේවකයන් වෙනුවෙන් සුභසාධන කටයුතු සහ විනෝද ක්‍රීඩා පහසුකම් සැලසීමට;

(ඕ) කාර්ය මණ්ඩලය වෙනුවෙන් වැටුප්, වේතන සහ අනෙකුත් පාරිශ්‍රමයන් නියම කිරීමට;

(ක) එවැනි කාර්ය මණ්ඩලවල සේවා නියමයන් සහ කොන්දේසි නියම කිරීමට;

(ග) කාර්ය මණ්ඩලයේ යහපත සඳහා අර්ථසාධක අරමුදලක් සංස්ථාපනය කොට විධිමත් කිරීමට සහ එවැනි අරමුදලකට හෝ යෝජනා ක්‍රමයකට දායක මුදල් ගෙවීමට

(ජ) පත්කිරීම්, පුහුණුවීම්, උසස්වීම්, පාරිශ්‍රමික ගෙවීම්, විනයානුකූල පාලනය, හැසිරීම, නිවාඩු ලබා දීම ද ඇතුළුව තම නිලධාරින් සහ සේවකයන්ට අදාළ නීති සෑදීමට;

(ට) කළමනාකරණ, පුහුණුවීම් හා අධ්‍යාපන මධ්‍යස්ථාන පිහිටුවා පවත්වා ගෙන යාමට;

(ඩ) කළමනාකරණයට අදාල සියලු ම අංගයන් සම්බන්ධව පර්යේෂණය කිරීමට, ඒවාට සහාය වීම, සම්බන්ධීකරණය කිරීමට සහ දිරිමත් කිරීමට;

(ත) ආයතනය විසින් සලකනු ලබන යම් සේවාවක් වෙනුවෙන් ගාස්තු අය කිරීමට;

(න) ආයතනයේ සාමාජිකයන්ට ගිණුම් තැබීම සම්බන්ධව නිර්ණායකයන් සහ ප්‍රමිතීන් නිකුත් කිරීමට;

(හ) ආයතනයේ බුද්ධිමය දේපළ අයිතිවාසිකම් සුරැකීමට;

(ය) (i) ආයතනයේ කළමනාකාරීත්වය සහ එහි අරමුණු ඉටු කර ගැනීම සඳහා මේ පනතේ සහ වෙනත් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති සෑදීම.

(ii) මෙම රීති සාදනු ලැබූ විට, මෙහි විධිවිධාන සලසා ඇති ආකාරයට ඒවා වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම, සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(ර) සංස්ථාවේ පරමාර්ථ නිසි ලෙස සහ ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය හෝ අවස්ථානුකූලව වෙනත් සියලු දේ කිරීමට.

ආයතනයට බලය ඇත්තේ ය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය.

**5.** (1) සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලට අනුකූලව (මෙහි මින් මතු ''සභාව'' යනුවෙන් සඳහන් කරනු ලබන) පහත සඳහන් අයගෙන් සමන්විත පාලක සභාවක් විසින් පරිපාලනය කළ යුත්තේ ය.

එනම්:—

(අ) සභාපති සහ ආයතනයේ අධි සාමාජිකයන් විසින් තම අධි සාමාජිකයන් අතුරින් තෝරාගනු ලබන උප සභාපතිවරයෙක්;

(ආ) නිල බලයෙන් පත් වන පහත දැක්වෙන සාමාජිකයන් එනම් —

(i) ශ්‍රී ලංකාවේ ප්‍රධාන වාණිජ මණ්ඩලයක සභාපතිවරයා හෝ ඔහුගේ නාමිකයා;

(ii) ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලයක ගණකාධිකරණ හා මූල්‍ය පීඨයේ ප්‍රධානියා හෝ ඔහුගේ නාමිකයා;

(iii) සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් හෝ ඔහුගේ නාමිකයා;

(iv) ශ්‍රී ලංකාවේ දේශීය ආදායම් කොමසාරිස්වරයා හෝ ඔහුගේ නාමිකයා.

(ඇ) සංස්ථාවේ සාමාජිකයන් විසින් තම සාමාජිකයන් අතුරින් තෝරා ගනු ලබන දෙදෙනෙක්;

(ඈ) මෙම පනත ක්‍රියාත්මක වීම ආරම්භ වීමට පෙරාතුව වූ දිනයේ දී සංස්ථාගත කිරීමට පෙර පැවති ''ද ඉන්ස්ටිටියුට් ඔෆ් සර්ටිෆයිඩ් පබ්ලික් එකවුන්ටන්ට්'' හි ආරම්භක අධ්‍යක්ෂ මණ්ඩලයේ නිල දැරූ තිදෙනෙක්, මෙම සාමාජිකයන් පසුව ආරම්භක අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන් විසින් දෑ අවුරුදු කාලයක් සඳහා මෙම සාමාජිකයන් නම් කරන අතර, ආරම්භක අධ්‍යක්ෂ මණ්ඩලයේ ජීවිත කාලය තුළ ම ඕනෑම වාර ගණනක් සඳහා නැවත පත් කළ හැකි ය;

(ඉ) මෙම පනත ක්‍රියාත්මක වීම ආරම්භ වීමට පෙරාතුවම දිනයේ දී සංස්ථාගත කිරීමට පෙර පැවැති ''ද ඉන්ස්ටිටියුට් ඔෆ් සර්ටිෆයිඩ් පබ්ලික් එකවුන්ටන්ට්ස්'' ආයතනයේ උපදේශක සභාවේ නිලදැරූ සාමාජිකයන් දෙදෙනෙක් කලින් පැවැති උපදේශක සභාවේ සාමාජිකයන් විසින් මෙම සාමාජිකයන් දෑ අවුරුදු කාලයක් සඳහා නම් කළ යුතු අතර, උපදේශක සභාවේ සාමාජිකයන්ගේ ජීවිත කාලය තුළ දී ඕනෑම වාර ගණනක් සඳහා නැවත පත් කළ හැකි ය;

(2) මෙම පනත ක්‍රියාත්මක වීමට පෙරාතුම දිනයේ දී ''ද ඉන්ස්ටිටියුට් ඔෆ් සර්ටිෆයිඩ් පබ්ලික් එකවුන්ටන්ට්ස්'' ආයතනයේ උපදේශක සභාවේ නිල දැරූ සාමාජිකයන් සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ නිල දැරූ අධ්‍යක්ෂවරුන් පස් දෙදෙකුගෙන් මෙයින් සංස්ථාපනය කරනු ලබන ආයතනයේ ප්‍රථම කාරක සභාව සමන්විත විය යුතු අතර, ඔවුහු පස් අවුරුදු කාලයක් නිල දැරිය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ (අ) සහ (ඇ) ඡේද අනුව සාමාජිකයන් තෝරා ගැනීම සඳහා වන ඡන්ද විමසීම පාලක සභාවේ රීති අනුව පැවැත්විය යුතු ය.

සභාවේ සාමාජිකයන්ගේ ධුර කාලය

**6.** (1) සභාවේ සෑම සාමාජියෙක්ම කලින් ධුරය අත්හලහොත් මිස, අවස්ථාවෝචිත පරිදි තමා පත් කිරීමේ දින සිට හෝ තෝරා පත් කර ගැනීමේ දින සිට අවුරුදු දෙකක කාලයක් සඳහා ධුර දැරිය යුතු ය.

එසේ ම තවදුරටත් මෙම වගන්තියේ (2) වන උපවගන්තියේ සඳහන් දිනයේ සිට අවුරුදු පහක කාලයක් අවසාන වීමෙන් ධුර දරන එම උපවගන්තිය යටතේ පත් කරන ලද සාමාජිකයන් ඉන්පසු ධුර අත්හැරිය යුතු නමුත් නැවත තෝරා පත් කර ගැනීම සඳහා සුදුස්සෝ වෙති.

(2) සභාවේ සාමාජිකයකු ඉල්ලා අස්වීම මගින් හෝ ආයතනයේ සාමාජිකයකු වීම අවසන් වුවහොත් හෝ 5 වන වගන්තියේ (1) වන

උපවගන්තියේ (අ) සහ (ඇ) ඡේද ප්‍රකාර ආයතනයේ සාමාජිකයකු වීම අහෝසි වුවහොත් තම ධුරය අත්හල යුතු ය.

(3) සාමජිකයකු මිය යාම හෝ සභාවේ සාමාජිකයකු විසින් ධුරය අත්හැරීම නිසා එම සාමාජිකයා වෙනුවට අවස්ථාවෝචිත පරිදි 4 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව වෙනත් තැනැත්තකු පත් කිරීම හෝ තෝරා පත් කර ගැනීම සිදු කළ යුතු අතර, එම සාමාජිකයාගේ ඉතිරි ධුර කාලය සඳහා ධුර දැරිය යුතු ය.

(4) කාලය ඉකුත් වීම නිසා තම ධුරය අත්හරින සභාවේ යම් සාමාජිකයෙකු නැවත පත් කිරීම සඳහා හෝ නැවත තෝරා පත් කර ගැනීම සඳහා සුදුස්සකු විය යුතු ය.

(5) සභාව විසින් සමාව දෙනු ලැබුව හොත් මිස 5 වන වගන්තියේ 1 වන උපඡේදයේ (අ) සහ (ඇ) උප ඡේද ප්‍රකාරව සාමාජිකත්වය අහෝසි වුවහොත් හෝ යම් සාමාජිකයකු සභාවේ රැස්වීම් හතරකට එක දිගට පැමිණීමට අපොහොසත් වුවහොත් එම සාමාජිකයා ධුරය අත්හැර ගියා සේ සලකනු ලැබිය යුතු ය.

**සංස්ථාවේ ප්‍රධාන විධායක නිලධරයා පත් කිරීම.**

7. (අ) සංස්ථාවේ කාර්ය මණ්ඩලයට සභාව විසින් ප්‍රධාන විධායක නිලධරයෙක් පත් කරනු ලැබිය හැකි අතර, ඔහු විසින් සංස්ථාවේ කටයුතු පරිපාලනය කරනු ලැබිය යුතු ය. ප්‍රධාන විධායක නිලධරයා සභාවේ සාමාජිකයකු විය හැකි ය;

(ආ) ප්‍රධාන විධායක නිලධරයා විසින් තමා වෙත පවරා ඇති බලතල ක්‍රියාත්මක කිරීම ද කාර්යය සහ කර්තව්‍ය ඉටු කිරීම ද සිදුකළ යුතු ය;

(ඇ) (අ) වන උපවගන්තිය යටතේ පත් කරන ලද ප්‍රධාන විධායක නිලධරයා සභාව විසින් ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(ඈ) සභාව විසින් තීරණය කරනු ලබන පාරිශ්‍රමිකයන් ප්‍රධාන විධායක නිලධරයාට ගෙවනු ලැබිය හැකි ය;

පත් කිරීම සම්බන්ධයෙන් ප්‍රධාන විධායක නිලධරයාට සභාවේ බලතල පැවරීම.

**8.** (අ) ආයතනයේ කාර්ය මණ්ඩලයට නිලධරයන් හෝ සේවකයන් පත් කිරීමට අදාළව සභාවේ බලතලවලින් යම් බලතල සභාව විසින් ප්‍රධාන විධායක නිලධරයාට පවරනු ලැබිය හැකිය. තමා වෙත පවරන ලද බලතල යටතේ ප්‍රධාන විධායක නිලධරයා විසින් පත් කරනු ලබන වෘත්තිය කාර්ය මණ්ඩලයේ සාමාජිකයන්ගේ පාරිශ්‍රමික ඇතුළු සේවා කොන්දේසි සභාවේ අනුමැතිය ඇතිව තීරණය කරනු ලැබිය යුතු ය:—

(අ) ප්‍රධාන විධායක නිලධරයා විසින් හෝ සංස්ථාවේ වෘත්තීය කාර්ය මණ්ඩලයේ නිලධරයෙක් හෝ සේවකයෙක් හෝ යම් සාමාජිකයෙක් විසින් කරනු ලබන කාර්ය මණ්ඩලයේ සේවයෙන් නෙරපීම සභාව විසින් අනුමත කරනු ලබන්නේ නම් මිස බලාත්මක නොවිය යුතු ය.

සංස්ථාවේ රීති.

**9.** (1) පහත දැක්වෙන සියලුම කරුණු හෝ ඉන් කිසිවක් සඳහා මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති, යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගේ තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන් කළින් කල ආයතනය විසින් සෑදීම නීත්‍යානුකූල වන්නේ ය.

(අ) සාමාජිකයන් වර්ග කිරීම, එක් එක් පන්තියට අයත් සාමාජිකයන් විසින් ගෙවිය යුතු සාමාජික ගාස්තු වර්ගීකරණය, ඔවුන් ඇතුළත් කර ගැනීම, ඉවත් කර ගැනීම, සාමාජික ගාස්තු නොගෙවීම මත නෙරපීම හෝ ඉල්ලා අස්වීම;

(ආ) ආයතනයේ විවිධ නිලධරයන්, අනුයෝජිතයන් සහ සේවකයන් පත් කිරීම, සේවයේ නියුක්ත කිරීම සහ සේවයෙන් නෙරපීම, ඔවුනගේ බලතල, කාර්යය, කර්තව්‍ය සහ හැසිරීම, පාරිශ්‍රමික ගෙවීම, අර්ථසාධක අරමුදල් සහ ඔවුන්ගේ ප්‍රතිලාභ සඳහා වූ වෙනත් යෝජනා ක්‍රම විධිමත් කිරීම;

(ඇ) ශිෂ්‍ය ලියාපදිංචි ගාස්තු, වාර්ෂික දායක මුදල්, විභාග ගාස්තු, දේශන ගාස්තු, අධ්‍යයන ග්‍රන්ථ සහ වෙනත් ප්‍රකාශනවල මිළ නියම කිරීම;

(ඈ) විශේෂිත විෂයයන් සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා සභාවේ සාමාජිකයන්ගෙන් සහ සංස්ථාවේ සාමාජිකයන්ගෙන් සමන්විත වන්නා වූ සභාවේ කමිටු සහ අනුකමිටු පත් කිරීම සහ එවැනි කමිටුවල කටයුතු විධිමත් කිරීම;

(ඉ) සංස්ථාවේ දේපළ පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම;

(ඊ) සංස්ථාවේ රැස්වීම්, වාර්ෂික මහා සභා රැස්වීම් සහ අතිවිශේෂ රැස්වීම් කැඳවීම් සහ පැවැත්වීම්, පුරප්පාඩු පිරවීම්, එම රැස්වීම්වල දැන්වීම් සහ න්‍යාය පත්‍රය, ඒ සඳහා ගණපූරණය සහ එහිදී සිදු කරනු ලබන කාර්යයන්;

(උ) ආයතනයේ සාමාජිකත්වය සඳහා සුදුසුකම් හා නුසුදුසුකම්;

(ඌ) විනය කමිටු පිහිටුවීම සහ ආචාර ධර්ම පද්ධතියක් සැකසීම, සාමාජිකයන් විෂයෙහි විනය පාලනය ක්‍රියාත්මක කිරීම, විනය පටිපාටිය සහ සාමාජිකයන් නෙරපීම හෝ සාමාජිකත්වය අත්හිටුවීම; සහ

(එ) සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරී පාඨමාලාව සඳහා සිසුන් ඇතුළත් කර ගැනීමට අදාළ ඇතුළත් කර ගැනීමේ උපමාන.

(2) මෙම පනත ක්‍රියාත්මක වීමට පෙරාතුවම පැවති සංගමයේ රීති මෙම පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවනතාක් දුරට ඒවා සංස්ථාවේ රීති ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒවා (1) වන උපවගන්තිය යටතේ රීතියක් සාදනු ලැබූ ආකාරයෙන් ම සහ එවැනි රැස්වීමක දී සහ එවැනි ආකාරයෙන් ම ඒවා සංශෝධනය කිරීම, ඊට යමක් එකතු කිරීම හෝ පරිච්ඡින්න කරනු ලැබිය හැකිය.

(3) සංස්ථාවේ සියලුම සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

සභාවේ රැස්වීම්.

**10.** (1) සභාවේ රැස්වීම් අවම වශයෙන් මාස දෙකකට වරක්වත් පවත්වනු ලැබිය යුතු ය.

(2) සභාවේ සෑම රැස්වීමක් පිළිබඳව එක් එක් සාමාජිකයාට අවම වශයෙන් දින හතක දැන්වීමක ලිඛිතව කළ යුතු අතර, එම රැස්වීමේ දී සිදු කරනු ලබන කටයුතු එම දැන්වීමේ නිශ්චිතව දැක්විය යුතු ය.

(3) සභාවේ සාමාජිකයන් පස් දෙනකු විසින් තත් කාර්යය සඳහා ලිඛිතව ඉල්ලීමක් කර දින හතක් ඇතුළත සභාපතිවරයා විසින් සභාවේ විශේෂ රැස්වීමක් කැඳවිය යුතු ය.

(4) සභාවේ සාමාන්‍ය රැස්වීමක් සඳහා වූ ගණපූරණය පැමිණ සිටින හෝ පෙරකලාසි මගින් පෙනී සිටින සාමාජිකයන් තුන් දෙනකු විය යුතු ය.

(5) සභවේ රැස්වීමකට පැමිණෙන සෑම සාමාජිකයකුටම සභාව විසින් තීරණය කරනු ලබන ප්‍රමාණයකින් සමන්විත වන ගාස්තුවක් හෝ එවැනි රැස්වීමකට පැමිණීමේ දී දැරීමට සිදුවූ යම් වියදමක් හානිපූරණය කිරීම සඳහා මුදලක් ගෙවනු ලැබිය යුතු ය.

(6) සභාවේ රැස්වීම්වල දී සභාපතිවරයා මුලසුන දැරිය යුතු අතර, සභාපතිවරයා පැමිණ නොසිටින විට එම රැස්වීමට පැමිණ සිටින සාමාජිකයන් බහුතරයක් විසින් තෝරා පත් කර ගනු ලබන සාමාජිකයෙක් එම රැස්වීමේ මුලසුන දැරිය යුතු ය.

(7) අසනීපවීම නිසා හෝ ශරීරික දුබලතාවක් නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා සභාපතිවරයාට තාවකාලිකව තම ධුරයේ කටයුතු ඉටු කිරීමට නොහැකි වන අවස්ථාවක සභාව විසින් ඔහු වෙනුවට වැඩ බැලීම සඳහා එක් සාමාජිකයකු පත් කරනු ලැබිය යුතු ය.

(8) සභාවේ රැස්වීමක දී තීරණය කරනු ලබන යම් කරුණක් හෝ දෙයක් පිළබඳව ඡන්ද සමාන වන අවස්ථාවක දී එම රැස්වීමේ සභාපතිවරයාට තම ඡන්දයට අමතරව තීරක ඡන්දයක් තිබිය යුතු ය.

(9) මෙහි අන්තර්ගත විධිවිධානවලට යටත්ව, සභාවේ කටයුතු සිදු කිරීමේ කාර්ය පටිපාටිය සභාව විසින් ම තීරණය කරනු ලැබිය යුතු ය.

සංස්ථාවේ සාමාජිකත්වය ලැබීමට සුදුසුකම්.

**11.** (අ) සංස්ථාවේ සාමාජිකත්වය ලබාගැනීම සඳහා පහත සඳහන් අවශ්‍යතා සපුරාලිය යුතු ය:—

1. මෙම පනත යටතේ පාලක සභාව විසින් පවත්වනු ලබන අවසාන පරීක්ෂණයෙන් සමත්ව තිබීම;

2. යටත් පිරිසෙයින් අවුරුදු තුනක අදාළ ප්‍රායෝගික පුහුණුව තබා ගැනීම;

3. ප්‍රායෝගික පළපුරුද්ද පිළිබඳව සෑහීමකට පත් විය හැකි වාර්තා ඉදිරිපත් කිරීම;

4. වයස අවුරුදු 21 ට වඩා අඩු නොවීම; සහ

5. වෘත්තීය ආචාර ධර්ම ඒකක සපුරා තිබීම.

(ආ) කවර හෝ නමකින් හඳුන්වනු ලබන්නා වූ ද, තත් කාලයේ දී සභාව විසින් සාදන ලද රීති මගින් අනුමත කරනු ලැබුවා වූ ද, සභාවේ මතය අනුව මෙම ආයතනයට සමාන තත්ත්වයක් ඇති සංගමයක් වූ ද, ගණකාධිකාරීන්ගේ යම් වෘත්තීය මණ්ඩලයක සාමාජිකයකු වන තැනැත්තෙක්.

සාමාජිකයන් වර්ගීකරණය කිරීම.

**12.** (අ) සංස්ථාවේ සාමාජිකයන්, අධි සාමාජිකයන්ගෙන් හා ආශ්‍රිත සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය.

(ආ) යම් ශිෂ්‍යයකු සංස්ථාවේ සියලු විභාග සමත් වී, සභාව විසින් නියම කරනු ලබන අනුමත ක්ෂේත්‍රයක අවම වශයෙන් අවුරුදු තුනක ප්‍රයෝගික පළපුරුද්ද ලබා සභාව වෙත ඉල්ලීමක් කිරීමේ දී සහ නියමිත ගාස්තුව සභාවට ගෙවීමේ දී එම ශිෂ්‍යයා සභාව විසින් ආයතනයේ ආශ්‍රිත සාමාජිකයකු ලෙස ලියාපදිංචි වීම සඳහා සුදුස්සකු වන්නේ ය. සංස්ථාවේ ආශ්‍රිත සාමාජිකයකු ලෙස සභාව

විසින් ලියාපදිංචි කිරීමේ දී එම සාමාජිකයාට, ඔහුගේ නමට පසු CPA යන කොටස භාවිතා කිරීමට අයිතිය ඇත.

(ආ) අවම වශයෙන් වසර තුනක ජ්‍යෙෂ්ඨ කළමනාකරණ හෝ සමාන පළපුරුද්දක් සහිතව වසර පහකට අඩු නොවන කාලයක් සඳහා ජ්‍යෙෂ්ඨ ගණකාධිකාරිවරයකුව, කළමනාකරණ උපදේශකයකුව හෝ කථිකාචාර්යවරයකුව සිටිනු ලැබූ බවට සභාව සෑහීමට පත්වන්නා වූ සංස්ථාවේ යම් සාමාජිකයකු විසින් නියම කරනු ලබන අවශ්‍යතා සපුරාලීමෙන් පසු සභාව වෙත නියම කරනු ලබන ඉල්ලීමක් මගින් සහ නියමිත ගාස්තුව සභාව වෙත ගෙවීමෙන් පසු සභාව විසින් සංස්ථාවේ අධි සාමාජිකයකු ලෙස ලියාපදිංචි වීම සඳහා සුදුසුකම් ලබන්නේ ය. අධි සාමාජිකයකු ලෙස සභාව සාමාජිකයකු ලියාපදිංචි කිරීමෙන් පසු කැමැත්තේ නම් තම නමට පසුව CPA යන නාමය එකතු කිරීමට එම සාමාජිකයාට හිමිකමක් තිබිය යුතු ය.

(ඇ) ආයතනයේ සෑම අධි සාමාජිකයකුට ම සහ ආශ්‍රිත සාමාජිකයකුටම Certified Public Accountant (CPA) යන නිල නාමය ලබා ගැනීමට හෝ එය භාවිතා කිරීමට අයිතිය තිබිය යුතු ය.

(ඈ) ආයතනයේ සාමාජිකයකු නොවන කිසිම තැනැත්තකු විසින් Certified Public Accountant (CPA) යන නිල නාමය හෝ ඉහත (ආ) සහ (ඇ) වන උපවගන්තිවල සඳහන් එකතු කිරීම ලබා නොගත හෝ භාවිතා නොකළ යුතු ය.

නිල නාම සහ ලාංඡනය භාවිතා කිරීම.

**13.** (1) යම් තැනැත්තකු 12 (ඇ) උප වගන්තිය යටතේ සුදුසුකම් ලබන්නේ නම් මිස සහ ආයතනයේ සභාව විසින් ලිඛිතව අවසරයක් ලබා දී ඇත්නම් මිස, කිසිම තැනැත්තකු විසින් විස්තරාත්මකව හෝ කෙටියෙන් යම් නිල නාමයක් ලබා ගැනීම හෝ භාවිතා කිරීම නැතහොත් සංස්ථාවේ ලාංඡනය භාවිත කිරීම නොකළ යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන කඩ කරන යම් තැනැත්තෙක් වරදකට වරදකරු විය යුතු ය.

සංස්ථාවේ බලතල.

**14.** සභාව, සුදුසු යැයි සිතන්නේ නම්, ආයතනයේ රීති, රෙගුලාසි සහ ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව වෙනත් වර්ගයේ සාමාජික වර්ගයන් ඇති කිරීමට සංස්ථාවට බලය ඇත්තේ ය.

සාමාජිකයකු පත් කිරීමේ ලා යම් දෝෂයක් තිබීමේ හෝ සාමාජිකයකුගේ පුරප්පාඩුවක් තිබීමේ හේතුව නිසා සංස්ථාවේ ක්‍රියා හෝ කටයුතු අවලංගු ලෙස සලකනු නොලැබිය යුතු බව.

**15.** සභාවේ යම් පුරප්පාඩුවක් තිබීමේ හෝ සභාවේ යම් සාමාජිකයකු පත් කිරීමෙහිලා යම් දෝෂයක් තිබීමේ හේතුව නිසාම පමණක් සංස්ථාවේ යම් ක්‍රියාවක් හෝ කටයුත්තක් අවලංගු ලෙස සලකනු නොලැබිය යුතු ය.

උපදේශක මණ්ඩලයක් පත් කිරීම.

**16.** (1) අවුරුදු දෙකකට වැඩි නොවන කාලයක් සඳහා විශිෂ්ඨ පුද්ගලයන් දහ දෙනකුට වැඩි නොවන සංඛ්‍යාවකගෙන් සමන්විත වන උපදේශක මණ්ඩලයක් සභාව විසින් පත් කිරීම නිත්‍යානුකූල වන්නේ ය. සභාව විසින් සිය අභිමතය පරිදි උපදේශක මණ්ඩලයේ අදහස් හා උපදෙස් පැතිය හැකි නමුත්, එවැනි උපදේශයක් භාර ගැනීමට හෝ ක්‍රියාවේ යෙදවීමට කිසිදු ආකාරයකින් සභාව බැඳී නැත.

(2) මෙම පනත ක්‍රියාත්මක වීමට පෙරාතුවම පැවැති ''ද ඉන්ස්ටිටියුට් ඔෆ් සර්ටිෆයිඩ් පබ්ලික් එකවුන්ටන්ට්'' හා උපදේශක මණ්ඩලයේ සාමාජිකයන්ගෙන් සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂවරුන් 5 දෙනකුගෙන් මෙමඟින් පිහිටුවනු ලබන සංස්ථාවේ ප්‍රථම පාලක සභාව සමන්විත විය යුතු අතර, ඔවුහු අවුරුදු 5 ක කාලයක් සඳහා ධුර දරනු ලබති.

සංස්ථාවේ අනුශාසකවරුන්.

**17.** සංස්ථාවේ අනුශාසකවරුන් ලෙස සේවය කිරීම සඳහා සභාව විසින් කලින් කල වෘත්තීය පසුබිමක් ඇති විශිෂ්ඨ දේශීය හෝ විදේශීය තැනැත්තන්ට ආරාධනය කළ හැකි ය. යම් ඇතුළුවීමේ ගාස්තුවක් හෝ වාර්ෂික දායක මුදලක් ගෙවීමට ඔවුන්ට නියම කරනු නොලැබිය යුතු ය.

**සාමාජිකයන්ගේ පාරිශ්‍රමිකය.**

**18.** සභාව විසින් තීරණය කරනු ලැබිය හැකි පාරිශ්‍රමිකයක් සංස්ථාවේ අරමුදල්වලින් සභාවේ සියලුම හෝ යම් සාමාජිකයකුට ගෙවනු ලැබිය හැකි ය.

**සංස්ථාවේ අරමුදල.**

**19.** (1) සංස්ථාවට එහිම අරමුදලක් තිබිය යුතු අතර, ත්‍යාග තෙස්තමේන්තු නීයාදන, පැවරුම්, පරිත්‍යාග, සම්මාදම් මුදල්, දායක මුදල්, ගාස්තු ප්‍රදාන හෝ මුල්‍ය ආයෝජන වශයෙන් මේ දක්වා ලැබූ හෝ මින් මතු ආයතනයට ලැබෙන හෝ සියලු මුදල් මණ්ඩලය විසින් තීරණය කරනු ලබන බැංකු එකක හෝ බැංකු වැඩි ගණනක ආයතනයේ අරමුදල් බැරට තැන්පත් කරනු ලැබිය යුතු ය.

(2) සංස්ථාවේ බලතල සහ කාර්යය ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම සඳහා සංස්ථාව විසින් දරනු ලැබූ සියලු වියදම් අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

(3) සංස්ථාව සතු මුදල්, ශ්‍රී ලංකා රජය විසින් නිකුත් කරනු ලබන හෝ ඇප වන යම් සුරැකුම්පත්වල ආයෝජනය කළ හැකිය.

**සංස්ථාව විසින් ගෙවිය යුතු සහ සංස්ථාවට අය විය යුතු ණය මුදල්.**

**20.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේ දී "ද ඉන්ස්ටිටියුට් ඔෆ් සර්ටිෆයිඩ් පබ්ලික් එකවුන්ටන්ට්" විසින් ගෙවිය යුතු සියලුම ණය සහ බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවනු ලැබිය යුතු අතර, එදිනට සංස්ථාවට අයවිය යුතු සියලු ණය සංගමයට ගෙවිය යුතු සම්මාදම් මුදල් දායක මුදල් මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

**විගණනය සහ ගිණුම්**

**21.** (1) සංස්ථාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) පාලක සභාව විසින් එහි ආදායම සහ වියදම සහ වත්කම් හා බැරකම් සහ ආයතනයේ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳව නිසි ගිණුම් තබා ගැනීමට කටයුතු සැලැස්විය යුතු ය.

(3) සංස්ථාව විසින් පත් කරනු ලබන සුදුසුකම් ලත් විගණකවරයකු විසින් සංස්ථාවේ ගිණුම් වාර්ෂිකව විගණනය කළ යුතු ය.

(4) මේ වගන්තියේ ''සුදුසුකම් ලත් විගණකවරයා'' යන්නෙන්:—

(i) ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරීවරයන්ගේ ආයතනය හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක

සාමාජිකයෙකු වන්නා වූ ද ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලැබූ සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක්; හෝ

(ii) ගණකාධිකාරී ව්‍යාපාරික සමාගමක් එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරිවරයන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක සාමාජිකයකු වන්නා වූ ද ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද එවැනි වරලත් ගණකාධිකාරී සමාගමක්,

අදහස් වේ.

**22.** (1) සංස්ථාව සම්බන්ධයෙන් යම් ගිවිසුම් පහත දැක්වෙන පරිදි සාදනු ලැබිය හැකි ය. ගිවිසුම්.

(අ) පෞද්ගලික තැනැත්තන් අතර ලිඛිතව සකස් කළ යුතු බවට නීතිය මගින් නියම කර ඇත්නම් එම ගිවිසුම් සංස්ථාවේ පොදු මුද්‍රාව යටතේ සංස්ථාව වෙනුවෙන් ලිඛිතව සකස් කළ යුතු ය;

(ආ) පෞද්ගලික තැනැත්තන් අතර සාදනු ලබන්නේ නම් ලිඛිතව සකස් කළ යුතු බවට, නීතිය මගින් නියම කර ඇත්නම් එය භාරව සිටින පාර්ශවයන් විසින් අත්සන් කළ යුතු බවටත් සංස්ථාව විසින් ඊට බලය පවරන ලද යම් තැනැත්තකු හෝ තැනැත්තන් විසින් ලිඛිතව සකස් කොට සංස්ථාව වෙනුවෙන් අත්සන් කරනු ලැබිය හැකිය;

(ඇ) පෞද්ගලික තැනැත්තන් අතර සාදනු ලබන්නේ නම්, ලිඛිතව සකස් නොකොට වාචිකව සකස් කරගනු ලැබුවද වලංගු වන බවට නීතිය මගින් නියම කර ඇත්නම් සංස්ථාව විසින් යථා පරිදි බලය පවරන ලද යම් තැනැත්තකු හෝ තැනැත්තන් විසින් සංස්ථාව වෙනුවෙන් වාචිකව සකස් කරනු ලැබිය හැකි ය.

(2) මේ වගන්තියට අනුව සාදන ලද ගිවිසුමක් නීතියෙහි ලා බලාත්මක වන අතර ආයතනය සහ ඊට අදාළ සියලු තැනැත්තන් සහ ඔවුන්ගේ නෛතික නියෝජිතයන් ඉන් බැඳී සිටි.

ගණකාධිකාරි වරයකු වශයෙන් පරිචයේ යෙදීම සඳහා සීමාවන්.

**23.** (1) සංස්ථාවේ සාමාජිකයකු වන තැනැත්තකු හෝ ගණකාධිකාරී සමාගමක කොටස්කරුවකු හෝ ගණකාධිකාරීවරයෙකු වශයෙන් පරිචයේ යෙදීම සඳහා තත්කාලයේ වලංගුව පවතින සහතික පත්‍රයක් නොමැතිව නම් ඔහුට ගණකාධිකාරීවරයෙකු වශයෙන් වෘත්තියෙහි නියැලීමට නොහැක්කේ ය.

(2) අධි සාමාජික, ආශ්‍රිත සාමාජික සහ කුමන හෝ ගණකාධිකාරී සමාගමක කොටස්කරුවනට විවිධ ගාස්තු නියම කළ හැකි ගාස්තු ගෙවීමෙන් පසු සභාව විසින් වෘත්තියේ නියැලීම සඳහා සහතික පත්‍රයක් නිකුත් කරනු ලැබේ.

(3) වෘත්තියෙහි නියැලීම සඳහා නිකුත් කරන ලද සෑම සහතික පත්‍රයක්ම එය නිකුත් කළ වර්ෂයේ දෙසැම්බර් මස 31 වන දා දක්වා බලාත්මකව පවතින අතර (2) උපඡේදයෙන් නියම කර ඇති ගාස්තු ගෙවීමෙන් පසුව වරින් වර අලුත් කරවා ගත හැකිය.

(4) ගණකාධිකාරි සමාගමක එක් එක් හවුල්කරු වෘත්තියේ නියැලීම සඳහා සහතික පත්‍ර දරා සිටින අවස්ථාවක, ගණකාධිකාරිවරයෙකු ලෙස වෘත්තියෙහි නියැලීම සඳහා එම සහතික පත්‍රය සමාගම විසින් අනුමත කළ යුතු වන්නේ නැත.

මෙම පනත යටතේ හෝ සංස්ථාවේ විධානය මත කරනු ලබන ක්‍රියා සඳහා ආරක්ෂාව.

**24.** (1) (අ) මේ පනත යටතේ සංස්ථාව විසින් සද්භාවයෙන් සිදු කරන ලද හෝ සිදු කරන ලදැයි අදහස් කරනු ලබන යම් නීත්‍යානුකූල ක්‍රියාවක් සඳහා සංස්ථාවට එරෙහිව; හෝ

(ආ) අවස්ථාවෝචිත පරිදි මේ පනත යටතේ හෝ සභාවේ විධානය මත යම් සාමාජිකයකු, නිලධාරියකු, සේවකයකු හෝ අනුයෝජිතයකු විසින් සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි අදහස් කරනු ලබන යම් ක්‍රියාවක් සඳහා එම සාමාජිකයාට, නිලධරයාට, සේවකයාට, හෝ අනුයෝජිතයාට එරෙහිව.

(2) මේ පනත යටතේ හෝ සභාවේ විධානය මත (1) වන උපවගන්තියේ නිශ්චිතව දැක්වෙන යම් තැනැත්තකු විසින් සිදු කරණු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් යම් අධිකරණයක් ඉදිරිපිට ඔහුට එරෙහිව පවරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී එම තැනැත්තා විසින් දරන ලද යම් වියදමක්, එම ක්‍රියාව සිදු කළ බවට අධිකරණය තීරණය කරන්නේ නම් සංස්ථාවේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

කිසිදු සිවිල් හෝ අපරාධ නඩුවක් පවරනු නොලැබිය යුතු ය.

**25.** සංස්ථාවට එරෙහිව පවරන ලද යම් නඩුවක දී සභාවේ සාමාජිකයකුට එරෙහිව හෝ ඔහුගේ දේපළට එරෙහිව කිසිදු රීට් බලපත්‍රයක් නිකුත් නොකළ යුතු ය.

සභාවේ සාමාජිකයකුට හෝ ඒ සාමාජිකයාගේ දේපළට එරෙහිව කිසිදු රීට් බලපත්‍රයක් නිකුත් නොකළ යුතු ය.

**26.** මේ පනත යටතේ යම් වරදක් සිදු කරන සෑම තැනැත්තෙක්ම, මහේස්ත්‍රාත්වරයෙකු ඉදිරිපිට නඩු විභාගයකින් පසු වරදකරු වීමේ දී මාස හයකට වැඩි නොවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් පන්සියයකට වැඩි නොවන දඩයකට හෝ එම දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකටම හෝ ඔහු යටත් විය යුතු ය.

වැරදි සහ දණ්ඩන

**27.** (1) මෙම පනතේ කාර්යයන් සඳහා යම් තැනැත්තකු ගණකාධිකාරිවරයෙකු වශයෙන් පරිචයේ යෙදෙන බව සලකන්නේ ඔහු විසින් ම හෝ හවුල්කරුවෙකු ලෙස හෝ ඔහුට ලැබෙන දීමනා හෝ ඔහුට ලැබිය යුතු දීමනා සැලකිල්ලට ගෙන ඔහු —

ගණකාධිකාරිවරයකු වශයෙන් යෙදෙන අයගේ ආරක්ෂාව.

(අ) ගණකාධිකාරිවරයෙක් ලෙස සේවයේ යෙදී සිටීම හෝ ගණකාධිකාරීවරයෙක් ලෙස ප්‍රසිද්ධියට පත් වීම; හෝ

(ආ) ඔහු මුදල් ගනුදෙනු, ගිණුම් පොත් හෝ ගිණුම් වාර්තා විගණනය කිරීමේ, හරි වැරදි බැලීමේ සේවයක යෙදී

සිටීම හෝ එසේ සේවයේ යෙදී සිටීම සඳහා ඉදිරිපත් වීම හෝ මුල්‍යමය ගිණුම්කරණය හා ආශ්‍රිත ප්‍රකාශන සකස් කිරීමේ, හරි වැරදි බැලීමේ හෝ සහතික කිරීමේ යෙදී සිටීම හෝ එසේ සේවයේ යෙදී සිටීම සඳහා ඉදිරිපත් වීම හෝ;

(ඇ) ගිණුම් ක්‍රියාපටිපාටිය, ප්‍රතිපත්තිමය කරුණු පිළිබඳ විස්තර සහ දත්තයන් සහතික කිරීම සම්බන්ධ වෘත්තිකයන් හෝ සහායකයන් සැපයීම හෝ;

(ඈ) ගණකාධිකාරීවරයකු ලෙස පරිචය කරනු ලබන පිණිස සභාව විසින් රෙගුලාසි මගින් ප්‍රකාශයට පත් කළ හැකි වෙනත් සේවා සැපයීමේ යෙදී සිටීම ද ඇතුළත් නොවන්නේ ය.

(2) යම් තැනැත්තෙක් රජයෙන් හෝ වෙනත් සේවා යෝජකයකුගෙන් වැටුප් ලබන සේවකයෙකු ලෙස ඔහුගේ හැකියාව මත (1) උපඡේදයේ සඳහන් කාර්යයන්හි නිරත වූ පමණින්ම ගණකාධිකාරීවරයෙකු ලෙස පරිචයේ යෙදෙන බව සැලකිය යුතු නොවන්නේ ය.

සංස්ථාවේ මුද්‍රාව තැබිය යුතු ආකාරය.

**28.** තත්කාලයේ බලාත්මකව පවත්නා ආයතනයේ රීතිවල දැක්වෙන විධිවිධානවල නියම කර ඇති තැනැත්තන් සංඛ්‍යාවක් ඉදිරිපිට මිස ආයතනයේ මුද්‍රාව කිසිම සාධන පත්‍රයකට තබනු නොලැබිය යුතු අතර, තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් ඔවුන් විසින් එකී සාධන පත්‍රයෙහි තම නම අත්සන් කළ යුතු ය. එම අත්සන් කිරීම සාක්ෂිකරුවෙකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමට බාහිරව විය යුතු ය.

විසුරුවා හැරීමේ දී ඉතිරිවන දේපළ.

**29.** සංස්ථාව විසුරුවා හැරීමේ දී එහි සියලු ණය හා බැරකම් පියවීමෙන් පසු කවර හෝ දේපළක් ඉතිරි වුවහොත් ඒ දේපළ සංස්ථාවේ සාමාජිකයන් අතර, බෙදනු නොලැබිය යුතු අතර, ආයතනයේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද ස්වකීය රීති අනුව යම් ආදායමක් හෝ දේපළක් ස්වකීය සාමාජිකයන් අතර බෙදා දීම, තහනම් කරනු ලබන්නා වූ ද වෙනත් යම් ආයතනයකට හෝ ආයතනවලට ඒ දේපළ දීම හෝ පැවරීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය. එම ආයතනය කවරේදැයි සංස්ථාව විසුරුවා හරින අවස්ථාවේ දී හෝ ඊට පෙරාතුවම හෝ සංස්ථාවේ සාමාජිකයන් විසින් තීරණය කරනු ලැබිය යුතු ය.

ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**30.** මේ පනතේ සඳහන් තැනැත්තන්ගේ සහ ඔවුන් මගින් ඔවුන්ගෙන් සහ ඔවුන් යටතේ හිමිකම් පාන්නවුන්ගේ අයිතිවාසිකම්වලට හැර, ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තන්ගේ හෝ අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් හානියක් හෝ බැලපෑමක් නොවිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**31.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර, යම් අනනුකූලතාවක් ඇතිවුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.